# සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර
# අනුස්මරණ දේශනය - 31

## උරුමය, දැනුමේ පරිණාමයක් ලෙස: ශ්‍රී ලංකාවේ මෑත ගල්යුගයේ පුරාවිද්‍යාව

**ආචාර්ය රාජ් සෝමදේව**
පුරාවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය

**පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**www.nie.lk**

**සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනය - 31**

**උරුමය, දැනුමේ පරිණාමයක් ලෙස: ශ්‍රී ලංකාවේ මෑත ගල්යුගයේ පුරාවිද්‍යාව**

ප්‍රථම මුද්‍රණය - 2021

© ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk
දුරකථන 011 7001601

ගෞරවණීය ස්වාමින්වහන්ස, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමණි, ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර පවුලේ සාමාජික මහත්ම මහත්මියනි, එම පවුලේ ඥාතිවරුනි, අංශ ප්‍රධානවරුනි, ප්‍රිය හිතවතුනි,

ජාතික අධ්‍යාපන ආයතනයේ අද දින පවත්වන මෙම වැදගත් අවස්ථාව හෙබවීමට මවෙත ආරාධනය කිරීම මා සලකන්නේ මට ලබා දුන් මහඟු අවස්ථාවක් හැටියටත් මා වෙත දක්වන ලද ගෞරවයක් හැටියටත් ය. මෙරට කෘතහස්ත දේශපාලනඥයෙකු වූත් අධ්‍යාපනය පිළිබඳ දාර්ශනිකයෙකු වූත්, විසිවන සියවසේ ජීවත් වූ විශිෂ්ට ගනයේ නායකයෙකු වූත්, දිවංගත ගරු ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ නාමය ස්මරණයට ලක් කරන මෙම වාර්ෂික සැසිය විවිධ ශික්ෂණවලට අයත් විද්වතුන් සහ වෘත්තිකයින් විසින් දිවංගත කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ නාමයට කරන බහුමානයක් ලෙස සිය අදහස්, අත්දැකීම් සහ දෘෂ්ටිවාද එකිනෙකා අතර හුවමාරු කර ගන්නා උද්දීප්තිමත් අවස්ථාවක් බවට පත්ව තිබේ. මීට පෙර අවස්ථාවල මෙම අනුස්මරණ දේශනය ඉතා උත්කර්ෂවත් ලෙස පවත්වන ලද කථිකයින් විසින් කන්නන්ගර පෞරුෂය ත්‍රිධාවිස්තෘත ව ගැඹුරු විශ්ලේෂණවලට ලක් කර තිබේ. එහි දී විශේෂයෙන් ම නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ගොඩනැගිය යුතු ස්වරූපය සහ එය ක්‍රියාවට නැංවිය යුතු ආකෘතිය පිළිබඳ ව ඔහු විසින් කල්පනය කරන ලද අනාගතවාදී විප්ලවීය දැක්මත් අවධානයට ගෙන තිබේ. මෙරට අධ්‍යාපනයේ අනාගතය ගැන කන්නන්ගර ශ්‍රීමතාණන් සතුව තිබූ භවිෂ්‍යත් විදර්ශනාව සහ ජාතිවාත්සල්‍ය ගුණයෙන් හෙබි පෙලැඹවීම ඔහු

විසින් කරන ලද එක්තරා විශේෂ දේශනයකින් පිළිබිඹු වෙයි. ඒ රටේ අධ්‍යාපන ඇමතිවරයා ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාව අමතා 1944 වසරේ ජූනි දෙවන දින නිදහස් අධ්‍යාපන පණතට අදාළ ව කරන ලද කථාව යි. එම වසරේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් ව තිබෙන එම කථාවේ එක් ඡේදයක් උපුටා දැක්වීමට මට ඉඩ දෙන්න.

> *"මහත්වරුනි, රෝමය, මහා ඔගස්ටස් අධිරාජ්‍යාගේ අතට පත් වන විට එය තනා තිබුණේ ගඩොලින් වුවත් පසු ව ඔහු එය කිරිගරුඬින් නිම කළේ ය. මේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටින ප්‍රභූන් කී දෙනෙකුට මෙරට අධ්‍යාපනය හිතකාමී යැයි පවසා එය බාල තත්ත්වයෙන් අතහැර දැමිය හැකි දැ? අප දකින්නේ එය විවෘත හසුනක් බවට පත් කළ යුතු මුද්‍රා තැබූ පොතක් ලෙස යි. අප එය දකින්නේ ධනවතුන්ට ප්‍රවේණියෙන් හිමි වූ එහෙත් මෙරට දුප්පතුන්ගේ උරුමයක් බවට පත් කළ යුතු දෙයක් ලෙසයි" (1944 හැන්සාඩ් වාර්තාව, පිටු අංක 916-946).*

යථෝක්ත ප්‍රකාශය මගින් මේ හෘදයාංගම පුරවැසියා පුරෝකථනය කරන්නේ අධ්‍යාපනයේ උරුමය රටේ දුප්පතුන් වෙනුවෙන් කැප කළ යුතු බව යි. දුප්පතුන් යනු බහුතරය යි. සාමාන්‍ය මිනිසුන්ගෙන් මෙම බහුතරය සමන්විත වේ. ජාතිය ගොඩ නැංවීමට සිය භෞතික ශ්‍රමය සහ බුද්ධිමය ධාරිතාව ආයෝජනය කළ අපගේ මුතුන්මිත්තන්ගේ උරුමයට අයත් සියල්ලෙහි ම අයිතිකරුවන් වන්නේ ඔවුන් ය. මා විසින්

මෙහි දී 'සියල්ල' යනුවෙන් සඳහන් කරන ලද සංකල්පය තුළ නිමග්න ව තිබෙන තීරණාත්මක සාධකය නම් අධ්‍යාපනය යි. අද මා ඔබ හමුවේ ඉදිරිපත් කිරීමට නියමිත දේශනයේ කොටසක් නියෝජනය කරන්නේ කන්නන්ගර ශ්‍රීමතාණන් විසින් රාජ්‍ය මන්ත්‍රණ සභාව ඉදිරියේ කරන ලද අනභිභවනීය කථාවේ දී උරුමය යනුවෙන් අදහස් කරන ලද කාරණය ඉස්මතු කොට දැක්වීම යි. අප සියලුදෙනා විසින් අතීතයෙන් උරුම කර ගත් අධ්‍යාපනයේ ප්‍රවේණිය දෙසට අවධානය යොමු කිරීමට දැන් මට අවසර දෙන්න.

## ප්‍රවේශය

මේ රටේ ගල් යුගයේ ජීවත් වූ පිරිස් හඳුන්වන්නේ මධ්‍යශිලා යුගයට අයත් දඩකරු-අන්නගවේශකයින් ලෙස ය. කාලය ගත වෙත් ම ඔවුන් සංස්කෘතිකමය වශයෙන් වෙනස්වීම්වලට ලක් වූ ආකාරයත් පසුව එම වෙනස්වීම් හරහා අඛණ්ඩ ව ඉදිරියට වර්ධනය වූ ආකාරයත් ගැන පුරාවිද්‍යාත්මක වශයෙන් අධ්‍යයනය කිරීම තවමත් ප්‍රමාද වී ඇත. මීට හේතුව එවැනි ක්ෂේත්‍රයක් පරීක්ෂා කිරීමට තරම් ප්‍රමාණවත් දත්තවල පවතින හිඟතාව යි. ප්‍රාග් ඓතිහාසික දඩකරු අන්නගවේෂකයින් විසින් සාර්ව පරිමාණයෙන් ශාක ආහාර පරිභෝජනය කිරීමට නැඹුරු වීමට එළැඹීම පෙන්නුම් කරන සාක්ෂි මෑත වකවානුවේ සිදු කර තිබෙන පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර වැඩ කටයුතුවල දී අනාවරණය වී තිබේ. මෙය ආරම්භ වී තිබෙන්නේ හොලෝසීනය නමින් හැඳින්වෙන මෑත භූ යුගයේ මැද භාගයේ දී ය. හොලෝසීන යුගයේ මධ්‍යම සහ පසු කොටසේ දී උදා වූ පරිසර තත්ත්වවලට දක්වන ලද අනුවර්තනශීලී

ප්‍රතිචාරයක් ලෙස හැඩගස්වා ගන්නා ලද නව ආර්ථික හැසිරීමක් මෙම විපර්යය මගින් සංකේතවත් කරනු විය හැකි ය. අප විසින් මෙහි දී සාකච්ඡා කරනු ලැබ ඇති පරිදි හොලෝසීන භූ අවධිය තෙත් සහ වියළි දේශගුණික අවධි කිහිපයකින් සමන්විත ව පැවති හෙයින් එම තත්ත්වය මධ්‍යශිලා යුගයේ ජීවත් වූ ප්‍රජාවට සැලකිය යුතු අන්දමකින් බලපාන්නට ඇත.

පරිණාමීය වැදගත්කමක් ඇති එමෙන් ම තවමත් සවිස්තරාත්මක ව පැහැදිලි කර නොමැති මෙම කාලය පිළිබඳ ව ක්‍රමානුකූල ව කරනු ලබන පර්යේෂණ වැඩසටහනකින් විපර්යයට ලක් වෙමින් සිටි ඒ ප්‍රජාවගේ සංස්කෘතික ගමයතාවන් ගැන වැටහීමක් ලබා ගත හැකි වන අතර එමගින් මෙරට පූර්ව සහ මුල් ඉතිහාස යුග සකස් වන ආකාරය ද පෙන්නුම් කිරීමට සමත් වනු ඇත. දනට කැණීම් කර තිබෙන බොහෝමයක් ගල්ගුහා සහ දියළු තැනිතලාවල ස්තර විනයාස මගින් පෙන්වා දෙනු ලැබ ඇත්තේ මධ්‍යශිලා යුගයේ සිට යකඩ යුගය හෝ මුල් ඓතිහාසික යුගය දක්වා වූ තාක්ෂණික - සංස්කෘතික පැන්නුමකි. මෙරට මධ්‍යශිලා යුගයට අයත් අවසන් අවධිය පුරාවිද්‍යාත්මක ව පිළිබිඹු වන්නේ ක්‍රිස්තු පූර්ව දෙවන සහ ස්‍රක වර්ෂයේ මුල් යුගය නිරූපණය කරන පාංශු ස්තර මට්ටම්වල දී ය (Deraniyagala, 1972). මධ්‍යශිලා යුගයේ මෑත අවධියක් පෙන්නුම් කරන වඩා විශ්වාසදායී දිනවකවානු ක්‍රිස්තුපූර්ව 1800ට යොමු වෙයි. එමගින් ඓතිහාසික යුගයේ ආරම්භය පිළිබඳ ව සාහිත්‍යමය සහ අභිලේඛන මූලාශ්‍ර මගින් වාර්තා කරන කාලයත් අතර සංස්කෘතිකමය වශයෙන් අප කිසිවක් නොදන්නා සහස්‍රයක පමණ කාල හිඩැසක් ඉතිරි කර තිබේ.

මධ්‍යශිලා යුගයේ දඩකරු අන්නගවේෂකයින් අතර සිදු වූ චර්යාත්මක වෙනස්කම් යථොක්ත තාක්ෂණික-සංස්කෘතික විපර්යයට පූර්වගාමී වන්නට ඇතැයි යන්න පළමු ව මේ සම්බන්ධයෙන් එලැඹෙන අභ්‍යුපගමනය යි. එම තාක්ෂණික සංස්කෘතික විපර්යය වනාහි හොලෝසීන යුගය තුළ සිදු වූ දේශගුණික විවිධතාවට සාර්ථකව මුහුණ දීම සඳහා ඔවුන් විසින් ඇති කර ගන්නා ලද නම්‍යතාවකි යන්න දෙවන කල්පිතයයි (eg. DeMenocal, 1995,2004; Cremaschi, 1998; Richerson et al, 2001; Petraglia et al, 2010).

තෙවනුව අතරමැදි දේශගුණික කලාපයක දකින්නට තිබෙන නිත්‍ය කාලගුණික වෙනස්කම්, එනම් වර්ෂාපතනය, සුළං රටා සහ උෂ්ණත්වය ආදි ගති ස්වභාවවල කෙටි කාලාන්තර දෝලනය හොලෝසීන යුගයේ දඩකරු අන්න ගවේෂකයින්ට සිය පැවැත්ම සඳහා ඉතා ඉහළ චර්යාත්මක නම්‍යතාවක් වෙත නැඹුරු වීමට ඉඩ සලසන ලද්දේ ය යන්න අප විසින් උපකල්පනය කරන ලදි. එහෙයින් අතරමැදි දේශගුණික කලාපවල පුරාවිද්‍යාත්මක සාධක පරීක්ෂා කිරීමෙන් වඩාත් ස්ථාවර දේශගුණික කලාපවලට පවතිනවාට වඩා වැඩි තීව්‍රතාවකින් සංස්කෘතික තාක්ෂණික හැසිරීමේ විපර්යයන් සහ අනුවර්තනශිලීත්වයන් නිරීක්ෂණය කරන්නට හැකි වෙතැ'යි අනුමාන කෙරිණි.

දේශගුණික දෝලනවලට එරෙහිව නම්‍යතාවක් ඇති කිරීමට වෑයම් කිරීමේ දී ප්‍රාග්ඓතිහාසික ප්‍රජාව අතර සාපේක්ෂ වශයෙන් සංකීර්ණ චර්යාවක් ජනනය කිරීමට පෙලැඹවීමක් ඇති කළේ ය. එමගින් ස්ථාවර දේශගුණික තත්ත්වයක් තිබෙන කලාපවලට

වඩා අතරමැදි දේශගුණික කලාප සංස්කෘතිකමය වශයෙන් වඩාත් සංවේදී ප්‍රදේශ ලෙස දිස් වෙයි. විද්වතුන් කිහිපදෙනෙක් ම පෙන්වා දී ඇති පරිදි සංවේදී දේශගුණික කලාපවල සැලකිය හැකි තරමේ ඉහළ අගයක් පෙන්නුම් කරන පරිසර ධාරිතාවක් පවතින අතර, අවුරුද්දේ වැඩි කාලයක් තිස්සේ එම ප්‍රදේශ මිනිසුන්ගේ ජීවත් වීමට සරිලන තරමේ ආහාර සංචිතයකින් ද සමන්විත ය (Rowley-Conwy, 1986; Gamble, 1986; Akazawa, 1982; Shinde et al,2004).

මධ්‍යශිලා යුගයේ වාසය කළ දඩකරු අන්න ගවේෂකයින්ගේ ජීවන රටාව තුළ පිළිබිඹු වන නම්‍යතාව විපර්ය සහ අනුවර්තනය කෙබඳු ස්වරූපයකින් වී ද යන ගැටළුවට ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් 2006 වසරේ පටන් ගවේෂණ මාලාවක් දියත් කෙරිණි. අප විසින් මීට අදාළ ව ගොඩ නගන ලද උපකල්පන පරීක්ෂා කිරීමට භූගෝලීය වශයෙන් භූමි තීරු කිහිපයක් විමර්ශනය කර තිබේ. ඒවා උතුරු පසින් හෝර්ටන්තැන්නේ පටන් මධ්‍ය කඳුකරයේ දකුණු බෑවුම දිගේ කල්තොට මොහොර පසුකොට දකුණින් උඩවළව නිම්නය දක්වා ද විහිදුණු පෙදෙසට අයත් ය. මේ ප්‍රදේශය එකිනෙකට වෙනස් දේශගුණික කලාප තුනක් නියෝජනය කරයි. ඒවා නම් (1) තෙත් කලාපය (2) අතරමැදි කලාපය සහ (3) වියළි කලාපය යි. මේ විවිධත්වය ආහාර සම්පත්වල පැතිරීමේ විස්තෘත බවක් පිළිබිඹු කරන අතර, භූ විෂමතාවේ සංකීර්ණ සැකැස්මක් ද සකස යි (පළමුවන සිතියම). මෙහි දී අපගේ උපකල්පනවලට අදාළ ව මෙතෙක් කරන ලද ගවේෂණ සහ කැණීම් කටයුතුවල ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට නියමිත ය.




පළමුවන සිතියම. අධ්‍යයන ප්‍රදේශය තුළ දේශගුණික කලාප තුනක ව්‍යාප්තිය දැක්වෙන සිතියම

## හොලෝසීන යුගයේ දේශගුණික වෙනස්වීම සහ පරිසරය

ක්ෂේත්‍ර වැඩ කටයුතුවල දී අවධානය යොමු කරන ලද කලාපය භූගෝලීය වශයෙන් වාර්ෂික වර්ෂාපතන අගය මිලිමීටර 1000ට අඩු නැගෙනහිර පස ගිනිකොණ දිග ශුෂ්ක-වියළි දේශගුණික කලාපයටත් බටහිරින් වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 3500ත්

4000 ත් අතර වන තෙත් පහත් බිමටත් සීමා වී තිබිණි. එහි දී උතුරු සීමාන්තය  වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2500ත් 300ත් අතර අගය වන තෙත් කඳුකරයෙන් ද දකුණින් වියළි කලාපයට අයත් වෙරළාසන්න තීරුවෙන් ද සීමා කරනු ලැබී ය. එම ප්‍රදේශයේ මැද කොටස වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 1000ත් 2000ත් අතර පරාසයකට අයත් ය (Chandrapala, 2007). මේ ප්‍රදේශයේ පොළව සානුවල පටන් දළ බෑවුම්වලින් ද මොහොර සහ නිම්නවල පිහිටි තැනිතලා දක්වා ද වෙනස් වේ. මේ භූ විෂමතාව පස්වල ව්‍යාප්තියේ වෙනස්කම් ඇති කිරීමට සෘජුව ම බලපෑමක් ඇති කර තිබේ.

ආචාර්ය රත්නසිරි ප්‍රේමතිලක විසින් පුරාණ පරිසරය පිළිබඳ කර තිබෙන සුවිශේෂී අධ්‍යයන (2003, *සහ තවදුරටත් බලන්න* Premathilake and Risberg, 2003; Premathilake and Gunatilleke, 2013) හැරුණු විට හොලෝසීන භූ අවධියේ දී ආසියාවේ වඩාත් දකුණේ පිහිටි ප්‍රදේශවල පැවති පරිසරය ගැන අප සතු දැනුම සීමිත ය. මේ කරුණ සම්බන්ධයෙන් යම් තරමක හෝ දැනුමක් ගැන අපට බලාපොරොත්තු තබා ගත හැකි වන්නේ ඉන්දියාවේ පුළුල් ප්‍රදේශවලට අදාළ ව කර තිබෙන පුරාණ පරිසරයට සම්බන්ධ තොරතුරු සමග සැසඳීමෙනි. දකුණු ආසියාවේ පොදු පරිසර තත්ත්ව පැවතීම නිසා (Singh, 1971; Premathilake, 2003:1) සමස්තයක් වශයෙන් ගත් කල හොලෝසින යුගය තුළ දකුණු ආසියාව මුහුණ දෙන ලද්දේ  සාපේක්ෂ වශයෙන් සිසිල් දේශගුණික තත්ත්වයකට ය (Shinde et al, 2001; Krishnamurti et al, 1981). කෙසේ වෙතත් හොලෝසීන යුගයේ දී දකුණු ආසියානු කලාපය තුළ පැවතියේ කලින් කලට චක්‍රානුකූල ව වෙනස් වෙමින් පැවති වියළි සහ තෙත් දේශගුණික තත්ත්ව මාලාවකි.

බටහිර සහ මධ්‍යම රාජස්ථානයේත් මධ්‍යම ගුජරාටයේත් ලවණීභවනය වූ විල්වලින් ලබා ගෙන තිබෙන අවසාදන විද්‍යාත්මක දත්තවලින් පෙන්වා දෙන පරිදි මින් පෙර වසර 10 000 කට පෙර හෝ ඊට ආසන්න වකවානුවේ දී මුදුන්පත්ව පැවතියේ අන්තර් වාරුණ දේශගුණික ස්වරූපයකි (Rajaguru, 1973:69-70; Gupta, 1974: 644-647; Agrawal and Kusumgar, 1974:64; Fairbridge, 1976:542). ඒ හා සමාන දේශගුණික තත්ත්වයක් පෙන්නුම් කරන පරිදි ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයට අයත් හෝර්ටන්තැන්නෙන් සොයා ගෙන තිබෙන සාක්ෂි ඒ සමග පහසුවෙන් සැසඳිය හැකි ය.

හෝර්ටන්තැන්නේ පස් ස්තර වින්‍යාසය මගින් පිළිබිඹු කරන ස්ථානීය පරාග කණිකා කලාප අංක දෙක යනුවෙන් හඳුන්වන දර්ශකයේ පහළ සීමාව මගින් නිර්දේශ කරන පරිදි මින් පෙර වසර 9900කට ඉහත දී එහි පැවති ඉහළ කඳුකරයේ වැවී තිබුණු වැසි වනාන්තර ශාක විශේෂ පෙන්නුම් කරයි. ඒ වනාහී පරිසරය අර්ධ ශුෂ්ක දේශගුණික තත්ත්වයක සිට සාපේක්ෂ වශයෙන් ඉහළ ආර්ද්‍රතා ස්වරූපයකට සංක්‍රාන්තිගත වීමක් සනිටුහන් කරන්න කි (Premathilake and Risberg, 2003:7). රාජස්ථානයේ මිරිදිය විල්වලින් ලබා ගෙන ඇති පරාගකණිකා සටහන් මගින් පෙන්වා දෙන ආකාරයට එම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මීට සමාන කාලවකවානුවක දී දැනට පවතින වාර්ෂික වර්ෂාපතන අගයට වඩා මිලිමීටර 250 ඉක්මවා ඉහළ ගිය බව පෙන්වා දී ඇත (Goudie et al, 1973:254; Deraniyagala, 2004:157). මේ තත්ත්වය හෝර්ටන්තැන්නේ දී පිළිබිඹු වන්නේ ස්ථානීය පරාග කණිකා අංක තුන මගිනි. ඉහළ කඳුකර වැසිවනාන්තර ශාක විශේෂ (නිද. *Calaphyllumwalkeri*)

පරිසරය තුළ ප්‍රචලිත වීම යනු වාර්ෂික වර්ෂාපතනය වර්ධනය වීම හඟවන ලක්ෂණයකි. මෙය මීට පෙර වසර 9900ත් 5400ත් අතර කාලවකවානුක දී සිදු වූ දෙයකි (Prematilleke and Risberg, 2003:8). හෝර්ටන්තැන්නේ පුරාණ දේශගුණික ඉතිහාසයේ තෙවන අවධිය අර්ධ ශුෂ්ක පරිසරයක් මගින් නිරූපිත වෙයි. ඊට අයත් සාක්ෂි තෙවන පරාග කණිකා කලාප අංක හතර මගින් ඉදිරිපත් වෙයි. එය මින් පෙර වසර 5400ත් 3600ත් අතර කාලයකට අයත් ය.

හොලෝසීන යුගයේ දේශගුණික තත්ත්ව ගැන සමස්ත දකුණු ආසියාව පුරා සිදු කර තිබෙන වැදගත් අධ්‍යයන බොහෝමයක් සාරාංශගත කරන ආචාර්ය සිරාන් දැරණියගල ශ්‍රී ලංකාව සඳහා අවධි හතරකින් යුත් දේශගුණික පරිවර්තන අනුපිළිවෙලක් යෝජනා කරයි. එනම් (1) ඉතා වියළි අවධිය (මින් පෙර වසර 10000 >) (2) තෙත් අවධිය (මින් පෙර වසර 6200) (3) වියළි අවධිය (මින් පෙර වසර 5000) (4) වියළි අවධිය (මින් පෙර වසර 3600). මෙම දේශගුණික දෝලන ඍතු වෙනස්වීම්වලටත් ප්‍රාග් ඓතිහාසික ජනතාවගේ වාසභූමි භූගෝලීය වශයෙන් ගොවිතැන් කිරීමටත් බලපෑමක් සිදු කරන්නට ඇත. විශේෂයෙන් ම මේ තත්ත්වය මෙම අධ්‍යයනය නාභිගත කර තිබෙන අන්තර් දේශගුණික කලාපය තුළ පැහැදිලි ලෙස පිළිබිඹු වනු ඇතැයි උපකල්පනය කළ හැකි ය. කෙසේ වෙතත් ප්‍රාග් ඓතිහාසික කණ්ඩායම්වල සංස්කෘතික තාක්ෂණික විපර්යය පිළිබඳ අපගේ අභ්‍යුපගමන පුරාණ දේශගුණයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ දැනට සනාථ කර තිබෙන අදහස් මත පදනම් ව ඇත.

## මධ්‍යශිලා යුගයේ සිට යකඩ යුගයට සංක්‍රාන්තිය

මධ්‍යශිලා යුගයේ අවසන් අදියර පුරාවිද්‍යාත්මක ව පෙන්නුම් කරනු ලබන්නේ ක්‍රිස්තු පූර්ව දෙවන සහස්‍රක වර්ෂයට අයත්

පස් ස්තර මට්ටම්වල දී ය. මේ බව සනාථ කරන විද්‍යාත්මක දින වකවානු මාතොට පැරණි වරායට තදාසන්න තැනක සිදු කරන ලද කැණීමකින් ලැබී තිබේ (Deraniyagala, 1972). පොළව මතුපිට සිට මීටර 10.2ක් ගැඹුරින් තිබෙන ස්තරවලට විකිරණශීලී කාබන් දින වකවානු තුනක් පවරා ඇත. ඒවා නම් 3520±45 BP [BM-2340] -ca.3830 cal BP- (*after* Pearson & Stuiver 1986), 3550± 70 BP [BM-2341] -ca. 3850 cal BP and 3790±70 BP [BM-2342] -ca. 4170 cal BP යනාදී වශයෙනි (Deraniyagala 1992:701). පරීක්ෂා කරන ලද මෙම ස්ථානයේ පැවති මධ්‍යශිලා යුගයට අයත් සංස්කෘතියේ ඉහළ සීමාව මින් පෙර මිනිත වසර 3800ට පෙර වකවානුවකට අයත් වන අතර එය භූ විද්‍යාත්මක වශයෙන් පෙරොන් නමින් හඳුන්වන ඉහළ මුහුදු මට්ටම් නැගීමේ මැත අවධිය සමග සමපාත වේ. ඒ අනුව මෙරට මධ්‍යශිලා යුගයේ සංස්කෘතියේ මැත අවධිය නිරූපණය කරන වඩා විශ්වාස කළ හැකි දින වකවානුව ක්‍රිස්තු පූර්ව 1800 ලෙස එහි දී යෝජනා කරනු ලැබ ඇත.

යකඩ ලෝහය භාවිතය, දේශීය  ව නිපදවන ලද කාළරක්ත වර්ණ වළං,  වී වගාව සහ ගෘහාශ්‍රිත කළ ගවයින් පරිහරණය යන ද ක්‍රිස්තු පූර්ව 900දී පමණ ආරම්භ වූ බව අනුරාධපුරයේ පැරණි ඇතුළු නුවරට අයත් ප්‍රදේශයේ කර තිබෙන පුරාවිද්‍යාත්මක කැණීම්වල ප්‍රතිඵල මගින් පෙන්වා දී තිබේ (Deraniyagala,1992:709). යකඩ භාවිතය ආරම්භ කළ යුගය ඓතිහාසික බෙදීම් අනුපිළිවෙල අනුව හඳුන්වන්නේ පූර්ව ඓතිහාසික යුගය යනුවෙනි. එම යුගයට අයත් අනෙක් ප්‍රධාන ලක්ෂණය ලෙස සලකනු ලබන්නේ මහාශිලා සම්ප්‍රදායේ සුසානභූමියි. ඒ සම්ප්‍රදායේ සුසානභූමි වැඩි සංඛ්‍යාවක් වියළි

කලාපයේ දක්නට ඇත. ඒ අතරින් මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉබ්බන්කටුව යටිගල්පොත්ත කලවැල්ලාඋල්පොත යන තැන්වල පිහිටි සුසාන සහ කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ගල්සොහොන් කනත්තේ පිහිටි සුසාන පුරාවිද්‍යාත්මක ව පරීක්ෂා කර තිබේ. ඉන් සොයා ගෙන තිබෙන සාක්ෂි අනුව එම සුසානභූමි ක්‍රිස්තු පූර්ව 768 සහ 383 අතර කාල පරිච්ඡේදය තුළ භාවිත කර ඇති බව පෙනේ (Deraniyagala,1992:734; Bandaranayake, 1992). අනුරාධපුරයේ පැරණි ඇතුළු නුවර කරන ලද කැණීමෙන් සොයා ගන්නා ලද යකඩ භාවිතය සහ කෘෂිකර්මයේ යෙදීම ආදි දේ පෙන්නුම් කරන ද්‍රව්‍යමය සාක්ෂි මධ්‍යශිලා යුගය සමග පරිණාමීය සබඳතාවක් නොපෙන්වයි. එහෙයින් මෙරට යකඩ භාවිත කිරීම සහ ඊට තදානුබද්ධ සංස්කෘතිය ආකස්මික ව පහළ වූවක් ලෙස යෝජනා කෙරේ.

## ගවේෂණ සහ කැණීම්

ඉහතින් සඳහන් කරන ලද පරිදි දඩකරුවන්ගේ සංක්‍රාන්තිය විමසීමට ලක් කරන මෙම ව්‍යාපෘතිය පරිසරාත්මක වශයෙන් තරමක පළල් භූමි තීරුවක් වෙත අවධානය යොමු කර තිබේ. එය හඳගිරිය සානුවේ පටන් කල්තොට මොහොර ප්‍රදේශය හරහා මධ්‍යම කඳුකරයේ දකුණු බෑවුම තෙක් විහිදෙයි (දෙවන සිතියම). 2006 වසරේ සිට 2009 වසර දක්වා ක්‍රියාත්මක කරන ලද ක්ෂේත්‍ර වැඩවල දී වළවේ ගංගාවේ මධ්‍යම නිම්නය වෙත අවධානය යොමු කරන ලදී. මෙම ප්‍රදේශයේ උපරිම මුහුදු මට්ටම් උස අඩි 500 නොඉක්මවයි. පසුව ගවේෂණ කටයුතු මුහුදු මට්ටමේ සිට අඩි 3000 දක්වා වූ වළවේ ගංගාවේ ඉහත්තාව තෙක් පුළුල් කරන ලදි.




**දෙවන සිතියම. අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථානවල ව්‍යාප්තිය දැක්වෙන සිතියම**

2010 සහ 2011 වසරවලදී සිදු කළ වැඩ කටයුතුවලට මුහුදු මට්ටමේ සිට අඩි 800 ත් 3000 ත් අතර ප්‍රදේශයේ පොළව මතුපිට විස්තෘතව කළ සොයා බැලීම් මාලාවක්ද ස්ථාන දෙකක

කරන ලද කැණීම්ද ඇතුළත් විය. පොළව මතුපිට ගවේෂණය කිරීමේදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ එකිනෙකට කිලෝමීටර 50 ක් පමණ ඈතින් පිහිටි ඕපනායක සහ හපුතලේ යන ප්‍රදේශ අතර කලාපය වෙතටය.

පොළව මතුපිට කරන ලද ගවේෂණවල ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම කඳුකරයේ දකුණු බෑවුමේ මුහුදුමට්ටමේ සිට අඩි 3000 ත් 5000 ත් අතර කලාපයෙන් පුරාවිද්‍යාත්මක වැදගත්කමක් තිබෙන තැන් කිහිපයක් හඳුනා ගැනිණි. ඒවා ප්‍රාග්ඓතිහාසික දඩකරුවන්ගේ තාවකාලික ජනාවාස වීමට බොහෝ දුරට ඉඩ තිබේ. හෝර්ටන්තැන්නේ සිට හපුතලේ දක්වා වූ කොටස පරීක්ෂා කරන ලද මෙම කලාපයට අයත්ය. නිරීක්ෂණය කරන ලද පරිදි ජනාවාසවල ව්‍යාප්තිය මගින් අප වෙත සංඥා කරනු ලබන්නේ ඒවා එකිනෙකට වෙනස් බියෝම හෙවත් ජෛව පද්ධති හරහා පැතිරී පැවති බවයි (මිනිසුන් ආහාර සෙවීමට සංචරණය කරන ආකාරය ගැන වැඩි විස්තර සඳහා බලන්න Butzer 1971 & 1985; Lieth 1973). කඳුබෑවුමේ පුලුල් පැතිරීමක් තිබෙන මෙකී ස්ථානවල තිරිවානා සහ කහඳගල්වලින් නිමවන ලද සැලකිය යුතු තරමින් ප්‍රාග්ඓතිහාසික ගල්මෙවලම් මතුපිට දක්නට තිබේ. වර්ග කිලෝමීටර 20 ක භූමි වපසරියක් තුළ ගල්මෙවලම් පොළව මතුපිට විසිරී තිබෙන තැන් 90 ක් හඳුනා ගැනිණි (සිතියම අංක 2).

බැලූ බැල්මට මෙම සංඛ්‍යාව එම ප්‍රදේශවල පැවති ජනාවාසවලින් 40%ක පමණ ප්‍රමාණයක් නිරූපණය කරනු ඇතැයි උපකල්පනය කිරීම සාධාරණ ය. දහ නම වන සියවසේ මුල් භාගයේ පටන්

තේ වගාව සඳහා පරීක්ෂා කරන ලද ප්‍රදේශයේ කර තිබෙන භූමි නවීකරණ කටයුතු නිසා ඉතිරිය මුළුමනින් ම විනාශයට ලක්ව ඇති බව පෙනේ.

කැණීමටලක් කිරීමෙන් ඉහතින් දක්වන ලද දේශගුණික කලාප තුළ හොලෝසීන යුගයේ මධ්‍යම සහ පසු අවධිවලට අයත් කාල-ස්තර අනුපිළිවෙළ වැඩිදුර පරීක්ෂා කිරීමට යෝග්‍යතාවක් ඇති තැන් කිහිපයක් තෝරා ගැනීමට ගවේෂණවලින් මඟ පෙන්වා ඇත. කැණීමට ලක් කරන ලද ගල්ගුහා සියල්ල නොගැඹුරු ස්තර වින්‍යාස පෙන්නුම් කරන අතර, ඒවායේ සංයුතිය ස්වාධීන පස් ස්තර 5කට වඩා අඩු සංඛ්‍යාවකි.

තෝරා ගන්නා ලද ගල්ගුහා 5ක් කැණීමට ලක් කර තිබේ. ඉන් පළමු වැන්න  පිහිටා තිබෙන්නේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රාස්සගල නමින් හැඳින්වෙන ගම්මානයේ තැනක ය. දෙවන ගුහාව බලංගොඩ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ඉලුක්කුඹුර නම් ගම්මානයේ කඳුබෑවුමක දක්නට තිබෙන ලුනුගල්ගේ නමින් හැඳින්වෙන පර්වත ආවරණයයි. කල්තොට පිහිටි උඩුපියන්ගල්ගේ සහ ඉලුක්කුඹුර මැද්දකන්දේ පිහිටි අලුගල්ගේ සෙසු තැන් ය. මේ අතරින් රාස්සගල ගල්ගෙය තෙත් දේශගුණයකින් යුත් කඳුකරයට ද ලුනුගල්ගේ සහ අලුගල්ගේ යනු වියළි කලාපයත් තෙත් කලාපයත් අතර අතරමැදි දේශගුණික කලාපයට අයත් ය. උඩුපියන්ගල්ගේ අයත් වන්නේ වියළි කලාපය ට යි.

## රාස්සගල

රාස්සගල ගල්ගුහාව යනු බලංගොඩ පොල්වතුගොඩ ග්‍රාම නිලධාරි වසමේ මුහුදු මට්ටමින් මීටර 730 ක උසින් පිහිටා

ඇති තැනකි. එහි දෑවැන්ත පර්වතයක් තිබේ. එහි නැගෙනහිර පස කෙළවර ගිනිකොණ දෙසට මුහුණ ලා ඇති ගල්ගෙයක් දක්නට ඇත. එහි ඇතුළත වපසරිය මීටර 10.5 × 17.4 කි. මෙම පර්යේෂණ වැඩසටහන යටතේ පළමු අවස්ථාවේ එම ගුහාව පරීක්ෂා කරන ලද අවස්ථාවේ එහි වැඩි කොටසක් ආවරණය වන පරිදි කුටියක් ඉදි කර තිබෙනු නිරීක්ෂණය කෙරිණි. කළුගල් කැබලිති යොදා ගනිමින් ඉදි කරන ලද බිත්ති ගල්ගුහාවේ පියස්ස දක්වා උසට ගොඩ නගා ඇත. පළමුවෙන් ම එය ඉවත් කරන ලදි. බිත්ති ඉදි කිරීමට අත්තිවාරම් කැපීමේ දී ගල්ගුහාවේ ඇතුළත පොළවට සෑහෙන තරමේ හානි සිදු ව තිබේ. ගම්වැසියන්ගෙන් ලද තොරතුරුවලට අනුව ටික කලකට පෙර බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක් කෙටි කලකට පෙර එහි වාසය කර ඇත. එතැන මෑත කාලීන වාසය කිරීම් සිදුව තිබෙන්නේ 1960 දශකයේ දී ය. මෙම ස්ථානයේ එක්තරා ගලක මතුපිට කොටා තිබෙන දිනය අනුව එතැන නැවත වරක් 1983 වසරේ දී වාසභූමියක් ලෙස ප්‍රයෝජනයට ගෙන තිබේ. මෑත කාලයේ ගැවසීම් හේතුවෙන් සිදුව තිබෙන ව්‍යාකූලතාවන් හැරුණු විට එතරම් වෙනස්කමක් එහි සිදුව ඇති බවක් නොපෙනේ. ගල්ගුහාව ආසන්න භූමියේ ඉතිරි වී තිබෙන කැලෑ තීරුව හැරුණු විට විසිවන සියවසේ මැදභාගයේ ආරම්භ කරන ලද තේ වගාව නිසා රාස්සගල ගල් ගුහාවේ හාත්පස භූමි දර්ශනය වෙනස්කම්වලට ලක්ව තිබේ.

## ලුනුගල්ගේ

මෙම ගල්ලෙන පිහිටා තිබෙන තැන රාස්සගල සිට කිලෝමීටර 30ක දුරින් පිහිටියේ ය. එතැන මුහුදු මට්ටම් උස මීටර 550කි.

ප්‍රවේශ විවරය දකුණු දෙසට පිහිටා ඇති මෙම ගල්ගෙය තීව්‍ර බෑවුමකට අයත් පටු සානුවක තිබෙන්නකි. මීටර 5.4ක් උසැති එහි ඇතුළත වපසරිය වර්ග මීටර 15.5 × 5.9 ප්‍රමාණයෙන් යුක්ත ය. ගුහා පොළවේ වම්පස මතුපිට පොළවේ සිට මීටර 2ක පමණ ගැඹුරට වන කොටස එනම් වර්ග මීටර 22ක් වූ සමස්ත ගුහා පොළවෙන් 24%ක් වූ ප්‍රමාණය නිදන් පහරන්නන් විසින් විනාශ කර තිබේ. ඔවුන් විසින් හාරන ලද වළේ පස් ගුහාවේ දකුණු පැත්තේ ගොඩ ගසා තිබෙනු දැකිය හැකි ය. ඒ පස් වර්ෂාවට සේදී යාම නිසා එහි තිබූ ප්‍රාග්ඓතිහාසික ගල් මෙවලම් දහස් ගණනක් ගල්ගුහාව අවට තැන තැන විසිර තිබේ. මැද නොගැඹුරු සිදුරක් දක්නට තිබෙන රවුම් ගල් තුනක් කැණීම්වල දී සොයා ගැනිණි. ජිද්‍රිත මිටි ලෙස හඳුන්වන ඒවා ගිනි දල්වා ගැනීමටත් මිටියක් ලෙස යමකට පහර දීමටත් පැරණි කාලයේ භාවිත කළ දේවල් ය.

ගල්මෙවලම් සහිත ව අනුපිළිවෙළින් තැන්පත් වූ පස් ස්තර තුනක් ලුනුගල්ගේ කැණීමෙන් නිරීක්ෂණය කරන ලදි. එය පහත විස්තර කර ඇති පරිදි උඩුපියන්ගල ගල්ලෙනෙහි දක්නට තිබූ පස් ස්තර වින්‍යාසයට සමාන වූ ස්වරූපයකි. මෙම කැණීමේ වැදගත් ම සොයා ගැනීම වූයේ පිලිස්සී ගිය ශාක ඇට එකතුව යි. එය වර්ග 24කට අයත් නිදර්ශනවලින් සමන්විත ය. ඒවා ප්‍රාග්ඓතිහාසික සම්භවයකින් යුක්ත ය. එසේ වුව ද ලුනුගල්ගේ මතුපිට පස් තට්ටුවල වාසය කර තිබෙන්නේ මුල් ඓතිහාසික යුගයට අයත් කණ්ඩායමකි. හොලෝසීන යුගයේ මැද භාගයෙන් මෙපිට අවුරුදු 3500ක පමණ දීර්ඝ කාලයක් තිස්සේ එම ගල්ගුහාව මිනිස් වාසයට යොමුව පැවති බව ඒ මගින් පෙන්නුම් කරයි.

## උඩුපියන්ගල්ගේ

පරීක්ෂා කරන ලද ගල්ගුහා අතරින් තෙවැන්න මුහුදු මට්ටමින් මීටර 249.50ක උසින් පිහිටා තිබෙන උඩුපියන්ගල්ගේ නමින් හැඳින්වෙන තැන යි. බලංගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් මොලමුරේ කඳුවැටියේ දකුණු බෑවුමේ එය පිහිටා තිබේ. දකුණු පසට මුහුණ ලා තිබෙන එම ගල්ගුහාව තරමක් විශාල ය. ඒ තුළ තිබෙන වාසය කිරීමට යෝග්‍ය අවකාශයේ වපසරිය වර්ග මීටර 330කි. එය මට්ටම් දෙකකට පිහිටා ඇත. පහළින් ඇති කොටස කෙළවර ගල් බැම්මක් බැඳ එහි බිම මඳක් ඔසවා හැසිරීමට නිසි ඇතුළත අවකාශයේ වපසරිය වැඩි කර ගැනීමට උත්සාහ කර තිබේ. ඒ නේවාසික අවශ්‍යතා සඳහා ය. ගම්වාසීයෙකුගෙන් ලද තොරතුරු අනුව එහි ඉහළ මට්ටම පිටින් ගෙනෙන ලද පස්වලින් පුරවා තිබේ. 1936 වසරේ දී මෙම ග්ලගුහාව ආචාර්ය පී. ඊ. පී. දැරණියගල විසින් පුරාවිද්‍යාත්මක ව පරීක්ෂා කරන ලදි. ගුහාව ඇතුළත කරන ලද කෙටි පරීක්ෂාවකින් අනතුරු ව ඔහු මෙලෙස ලියා තිබේ.

> *..........මෙහි) අර්ධ චන්ද්‍රාකාර ක්ෂුද්‍ර ගල්මෙවලම් සහ රවුම්ගල්වලින් සකසන ලද මිටි දක්නට තිබීම යනු මධ්‍යශිලා යුගය නවශිලා යුගය දක්වා පරිවර්තනය වූ බව යෝජනා කරන සාක්ෂීන් ය (1958 246).*

2016 වසරේ දී මෙම ගුහාවේ ඉහළ මට්ටමේ පිහිටි තැනක කැණීමක් සිදු කෙරිණි. එහි දී පොළව මතුපිට සිට මීටර 1.55ක ගැඹුරක් දක්වා අනුපිළිවෙළින් පිහිටා ඇති පස් ස්තර 3ක් නිරීක්ෂණය කෙරිණි. මේ අතරින් පළමු වන සහ දෙ වන පස්

ස්තරවල තිරිවානා සහ කහඳ ගල්වලින් නිමවන ලද ගල්මෙවලම් දකින්නට තිබිණි. ඒවා අතරින් මහර නිදර්ශන ශ්‍රී ලංකාවේ අන් ප්‍රාග්ඓතිහාසික සථානවල දක්නට නොමැති අන්දමේ නව ආකෘතිවලින් සමන්විත වූ ඒවා යි. තුන්වන ස්තරයේ දී පුරාවස්තුවල ඝනත්වය අඩුවීමට ලක් වේ. ඊට අමතර ව භුක්තාවශේෂ අස්ථි මෙවලම් ගොන්නක් ද ඉන් වාර්තා වී ඇත. ඉතා විශාල කැබලි සංඛ්‍යාවකින් සමන්විත සත්ත්ව අස්ථි සහ ගොළුබෙලි කටු (අකාවුස් පලුඩොමුස් සහ ඔලිගොස්පෙයිරා යන විශේෂවලින් සමන්විත) සමුච්චය මගින් කාරණා දෙකක් යෝජනා කිරීමට ඉඩ තිබේ. සමහර විට ඒ ගල්ගුහා තුළ කිසියම් පිරිසක් දීර්ඝ කාලයක් තිස්සේ ජීවත් වී සිටියා වීමට ඉඩ ඇත. එසේ නොවේ නම් සැලකිය යුතු තරමේ විශාල සංඛ්‍යාවකින් යුත් කණ්ඩායමක් ඍතු වෙනස්කම් අනුව කාලයෙන් කාලයට එහි වාසය කළා විය යුතු ය.

මෙම ගල්ගුහාවේ තිබී සොයා ගන්නා ලද පුරාවස්තු අතර කහඳ ගල්පතුරකින් තනන ලද ගෙල පළඳින තැලි දෙක අගනා සොයා ගැනීමකි. අප විසින් එය අර්ථ දක්වා තිබෙන්නේ සංකේතාත්මක මානවකෘතියක් ලෙස ය.

## අළුගල්ගේ

කැණීමකින් පරීක්ෂා කිරීමට තෝරා ගන්නා ලද සිව් වන ගල් ගුහාව අළුගල්ගෙය යි. එය පිහිටා තිබෙන්නේ මුහුදු මට්ටමේ සිට මීටර 360ක් උසැති ඉළුක්කුඹුරේ මැද්දකන්දේ වනගත කඳු බෑවුමක ය. එහි ගුහා ප්‍රවේශයේ පළල මීටර 6ක් වන අතර ගුහාවේ උපරිම උස මීටර 2.5කි. ගුහාව ඇතුළත බිමේ වපසරිය වර්ග මීටර 30කි. ගුහාව ඇතුළත තිබූ ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් සුන්බුන් සහිත තැන්පතුවේ ඝනකම මීටරයක් පමණ වේ.

කැණීමෙන් සොයා ගන්නා ලද දේ අවට තිබෙන අන් ගුහා පරීක්ෂා කිරීමේ දී සොයා ගන්නා ලද දේවලට බොහෝ සෙයින් සමානකම් දක්වුව ද අළුගල්ගෙයින් ලැබෙන සාක්ෂි මධ්‍ය හොලෝසීන යුගයේ ආර්ථිකය සම්බන්ධයෙන් නව අදහස් ජනනය කරන සුළු ය. එහි තිබී සොයා ගන්නා ලද මෝරුන්ගේ දත් සහ කොරල් කැබලි එම ගුහාව වාසය කළ කණ්ඩායම් මුහුද සමග දක් වූ සබඳතාව හෙළි කරයි. අළුගල්ගේ සිට මුහුදට ඇති දුර කිලෝමීටර 40කට ආසන්න ය. විකිරණශීලී කාබන් දින වකවානු මගින් පෙන්වා දෙනු ලැබ ඇති ආකාරයට ලුනුගල්ගෙය භාවිත කළා සේම මෙම ගුහාව ද දිගු කාලයක් තිස්සේ වාසභූමියක් ලෙස භාවිතයට ගෙන තිබේ.

**1වන වගුව. කැණීමට ලක් කරන ලද ගල්ගුහාවල පැවති ප්‍රාග්ඓතිහාසික මට්ටම්වලට හිමි විකිරණශීලී දිනවකවානු**

| කැණීම් කළ තැන | නියැදි අංකය | සොයා ගත් තැන | විද්‍යාගාර විමර්ශනය | සම්මත දිනය | ගණනය කළ දිනය (සිග ᴾමා 2) |
|---|---|---|---|---|---|
| ඉළුක්කුඹුර | ILK/2015/ S3 | ප්‍රසංග අංක 5 | Beta 422152 | 5060 ± 30 BP | Cal. BC. 3955 to 3780 |
| | | ප්‍රසංග අංක 4 | Beta 422151 | 5350 ± 30 BP | Cal. BC 4320 to 4290 |
| අළුගල්ගේ | ALG/2016/ S2 | level III-IX | Beta 448329 | 4630 ± 30 BP | Cal. BC 3505 to 3452 Cal. BC 3380 to 3355 |
| උඩුපියන්ගල්ගේ | UPG/2015/ | ප්‍රසංග අංක 3 | Beta 450381 | 8680± 30 BP | Cal. BC 7745 to 7595 |

## ප්‍රතිඵල

2013 වසරේ දී කරන ලද ගවේෂණයෙන් සැලකිය යුතු තරමේ පුරාවස්තු සංඛ්‍යාවක් සොයා ගැනීමට හැකි විය. ඇඹරුම්ගල් අත්ගල් සහ ඉතා සියුම් ව නිපදවන ලද ක්ෂුද්‍ර ගල් මෙවලම් යන ද ඔවුන් ජීවත් වූ අවට පරිසරයේ තිබෙන වනසර තෘණ වර්ග පරිභෝජනය කිරීමට පෙළඹීමේ නව නැම්මක් පෙන්නුම් කිරීමක් විය හැකි ය. මෑත කාලයේ කර තිබෙන පුරාවිද්‍යාත්මක කැණීම් මගින් හෙළිදරව් කර ඇති දින වකවානු අනුව මෙම වෙනස සිදු වූ කාලය ක්‍රිස්තු පූර්ව පස් වන සහස්‍රක වර්ෂයට යොමු කරනු ලැබ ඇත.

## සම්පත් උද්ධරණය

කඳුකර තෙත් කලාපයටත් අතරමැදි දේශගුණික කලාපයටත් මායිම් වන ප්‍රදේශයේ වාසය කළ ප්‍රාග් ඓතිහාසික ප්‍රජාව විසින් ඇට වර්ග, ධාන්‍ය වර්ග සහ බීජ වර්ග ඇතුළු ශාක ආහාර උද්ධරණය කිරීමේ මූලික අත්හදා බැලීම් ආරම්භ කරන්නට ඇත්තේ ක්‍රිස්තු පූර්ව 5000ට ආසන්න කාලයක දී විය යුතු ය. මේ බව කැණීමට ලක් කරන ලද ගල් ගුහා තුනෙන් සොයා ගෙන තිබෙන පිලිස්සී ගිය ශාක ඇට සමුච්චයෙන් පැහැදිලි වෙයි. ඒ අතරින් දික්කැකුණ (*Carneriumzeylanicum)* ඇට පහසුවෙන් ම හඳුනා ගැනීමට හැකි වූ තරම් පැහැදිලි ය. දික්කැකුණ ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට ආවේණික වූ ශාකයකි. ප්‍රාග්ඓතිහාසික ප්‍රජාව විසින් බොහෝ කාලයක පටන් දික්කැකුණ ආහාරයට ගැනීම පෙන්නුම් කරන සාක්ෂි රටේ වෙනත් තැන්වලින් ද වාර්තා වී තිබේ (මේ සඳහා බලන්න Deraniyagala, 1992: 452).

ගින්නට හසු වීම නිසා බොහෝමයක් ශාක ඇට වර්ගවල මතුපිට පෙනුම වෙනස් වී ඇත. එහෙයින් බාහිර අණ්වීක්ෂීය පරීක්ෂාවකින් ඒ ඇටවල අනන්‍යතාව හඳුනා ගැනීම දුෂ්කර කටයුත්තකි. මේ හේතුව නිසා වැඩිදුර පරීක්ෂාව සඳහා එම ඇට නියැදියක් කොළඹ කර්මාන්ත තාක්ෂණික ආයතනය වෙත යැවීමට කටයුතු කෙරිණි. එහිදී එම ඇටවලින් ලබා ගන්නා ලද සියුම් පටල, අණ්වීක්ෂීය පරීක්ෂාවට ලක් කරන ලදි. මීට අමතර ව මෙකී ගල් ගුහා අවට ප්‍රදේශයේ වැවෙන වනසර ඇට වර්ග හඳුනා ගැනීමේ අරමුණින් ක්ෂේත්‍ර වැඩ මාලාවක් දියත් කිරීමට කටයුතු යෙදී ය.

එහි ප්‍රතිඵලයක් ලෙස කැණීමෙන් සොයා ගන්නා ලද පිලිස්සී ගිය ශාකඇට සමුච්චයට අමු ගසේ ඇට ඇතුළත් වන බව පෙන්වා දී ඇත. මෙකී බොහෝමයක් ඇටවල සෛල ව්‍යුහ ආහාර සකස් කිරීමේදී අධික තාපයට ලක් වීම නිසා විනාශයට පත්ව තිබෙන බව පියවි ඇසින් පරීක්ෂා කරන විට පෙනේ. එබැවින් එම ශාක ඇට නියැදිය වැඩිදුර විශ්ලේෂණය කිරීමට කොළඹ පිහිටි කර්මාන්ත තාක්ෂණික ආයතනයේ සහය ලබා ගැනීමට කටයුතු කළේය. එහිදී එහි විද්‍යාඥයින් විසින් ශාකපටක හඳුනා ගැනීම සඳහා නියැදිය ෆාමකොග්නිස්ටිකල් විශ්ලේෂණයකට (Pharmocognistical analysis) ලක් කෙරිණි. මෙම විශ්ලේෂණයේදී නියැදියෙන් ලබා ගන්නා සියුම් පටල අණ්වීක්ෂීය පරීක්ෂාවකට ලක් කරයි. යථොක්ත පරීක්ෂාවේ ප්‍රතිඵලයක් ලෙස එම නියැදිවල ශාක ප්‍රභවය පිළිබිඹු කරන ස්ලෙරෙන්චයිමා (*sclerenchyma)* පටල, ඇනියුලර් සයිලම් *(annuler xylem)* අපිචර්ම සහ ට්‍රයිකෝම (*trichomes*) හඳුනා ගෙන තිබේ (ඡායාරූපය අංක 2a, 2b). ෆාමකොග්නිස්ටිකල් විශ්ලේෂණය යනු මතුපිට රූපවිද්‍යාත්මක ලක්ෂණ විකෘත් වූ ශාක ඇට හඳුනා ගැනීමට ඉවහල් කර ගත හැකි ප්‍රයෝජනවත් ක්‍රමවේදයක් බව මූලික අධ්‍යයනවලින් තහවුරු කර තිබේ.



2a වන රූපය. නියැදියෙන් ලබා ගත් ශාක පටලයක අණ්වීක්ෂිය ඡායාරූපයක් (ඡායාරූපය: සී. අබේගුණවර්ධන)



2bවන රූපය. නියැදියෙන් ලබා ගන්නා ලද තවත් ශාක අවශේෂයක අණ්වීක්ෂීය ඡායාරූපයක් (ඡායාරූපය: සී. අබේගුණවර්ධන)

කැණීම පවත්වනලද ප්‍රදේශය සිසාරා ශාකවල ව්‍යාප්තිය සහ මානව සම්බන්ධතාව ගැන සමීක්ෂණයක් දියත් කෙරිණි. එහි අරමුණ ලෙස සලකන ලද්දේ අවට ගම්වල වාසය කරන සම්ප්‍රදායික වෛද්‍ය වෘත්තිකයින්ගෙන් කැණීමෙන් සොයා ගන්නා ලද ඇටවර්ග හඳුනාගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු ලබා ගැනීමයි (ඡායාරූපය අංක 3).



3 වන රූපය . ප්‍රාදේශීය වෙදදුරන් සමග සාකච්ඡා කරන අවස්ථාවක අතරමැද (ඡායාරූපයඃ ඕ. දේවගේ)

ඔවුන්ගේ නිරීක්ෂණ අනුව කැනීමෙන් ලබාගත් ශාක ඇට නියැදියේ 'අමු' යන නමින් (*Paspalum sp.*) ගැමියන් විසින් හඳුන්වන ඇට වර්ගයට අයත් නිදර්ශන දක්නට තිබීම සිත් ගන්නා සුළු කාරණයකි.

දකුණු ආසියාවේ ප්‍රජාව අමු වර්ගයේ ඇට ආහාරයට ගැනීම පිළිබිඹු කරන පැරණිතම සාක්ෂි වාර්තා වී තිබෙන්නේ උතුරු පකිස්ථානයේ පැරණි හරප්පා නගරයෙනි. ඒ ක්‍රිස්තු පූර්ව

3300ත් 1900ත් අතර කාලයකදී ය (Kenoyer, 1998; Weber, 1999). කැණීමෙන් සොයා ගන්නා ලද අපගේ නියැදියට ඇතුළත් අමු වනාහී එම විශේෂය ගෘහාශ්‍රිත කිරීමට පෙර කරන ලද අත්දැකීමක් පිළිබිඹු කරන්නක් ලෙස සැලකිය හැකි ය. 2013 වසරේ දී හල්දුම්මුල්ලේ වල්මීතලාවේ එක්තරා තැනකින් සොයා ගන්නා ලද ඇඹරුම් ගල් සහ ඒවායේ අත්ගල් (4වන රූපය) පෙර කී පරිදි වනසර ශාක සම්පත් උද්ධරණය සක්‍රිය කිරීමට අදාළ ව ගන්නා ලද තීරණ හරහා හඳුන්වා දෙන ලද නව ජනනයන් ලෙස දැක්විය හැකි ය (Somadeva, 2014). අළුගල්ගේ කැණීමෙන් සොයා ගන්නා ලද පිලිස්සී ගිය මැටි කැබලිති ප්‍රාග්ඓතිහාසික වැසියන් වළං නිෂ්පාදනය අත්හදා බැලීමට ගත් සාධනීය උත්සාහයක ප්‍රතිඵලයක් බව දැන් තේරුම් ගෙන ඇත. එය පූර්ව යකඩ යුගයේ පහල වූ නව ජනනාත්මක අත්දැකීමකි.



**4වන රූපය. ක්ෂේත්‍ර සමීක්ෂණය අතර වල්මීතලාව නම් ස්ථානයෙන් සොයා ගන්නා ලද ඇඹරුම්ගල් (ඡායාරූපයඃ කර්තෘ විසිනි)**

මෙම පරිවර්තනය සිදු වූ අවධියේ ප්‍රාග්ඓතිහාසික වැසියන් විසින් දඩයම් කරන ලද සතුන් තෝරා ගැනීමේදී ඊට පෙර කාලයට සාපේක්ෂව වෙනසක් සිදුව තිබේ. එය පිළිබිඹු වන්නේ ලෑටි ගානා කුඩා සතුන් අඳුන් දිවියන් සහ උරගයින් දඩයම් කිරීමට වැඩි නැඹුරුතාවක් දැක්වීම මගිනි. එකල කුඩා ප්‍රමාණයේ වඳුරන්ද දඩයම් ගොදුරු බවට පත්ව තිබේ. කුඩා සතුන් දඩයම් කිරීමේ නැඹුරුව සමහර විට හොලෝසීන යුගයේ දඩකරුවන් සිය දඩයම් වෘත්තියේදී ඊට යෙදිය යුතු ශක්තිය අවම කිරීමේ අදහසින් කරන ලද්දක් විය යුතුය. පෙර යුගයේ දඩයම් කරන ලද තිත්මුවන් සහ ගෝනුන්ගේ ඝනත්වයට සාපේක්ෂව ඒ සතුන් දඩයම් කිරීම මේ කාලයේදී පිරිහීමට ලක් වීම සැලකිල්ලට ගත යුතු කාරණයකි.

## තාක්ෂණය

ගවේෂණයට ලක් කරන ලද ප්‍රදේශයේ තිබෙන 80 කට වඩා වැඩි සංඛ්‍යාවක් වූ තැන්වලින් සොයා ගෙන තිබෙන ගල්මෙවලම් රටේ වෙනත් ප්‍රාග්ඓතිහාසික වාසස්ථානවලින් හමු වී තැන් මෙවලම් සමග සසඳන විට කැපී පෙනෙන ආකාරයේ ඉහල තාක්ෂණික විවිධතාවකින් යුක්තය (Deraniyagala1992:185; Perera 2010: 107). ෆෝර්ම් ට්‍රිම්ඩ් යනුවෙන් පුරාවිද්‍යාඥයින් විසින් හඳුන්වන ක්‍රමවේදයට අනුව සකසන ලද ගල්මෙවලම් පරීක්ෂා කරන ස්ථානවලින් සුලභව ලැබෙන බව පෙනෙන්නේ අන් තැන්වලින් ඒවා ලැබෙන ඝනත්වය සැලකිල්ලට ගත් විටය. එම තාක්ෂණයෙන් නිපදවන ලද ගල්මෙවලම්වල සාමාන්‍ය ඝනත්වය 12.46% (N = 1226) වන අතර එය මින් පෙර මෙරට ප්‍රාග්ඓතිහාසික ස්ථානවලින් සොයා ගෙන ඇති එම වර්ගයේ මෙවලම්වලට සාපේක්ෂව 0.2% ක වර්ධනයකි. ඉතා සියුම්

තිරිවානා තල නිපදවීමට මේ කාලයේදී වැඩි නැඹුරුවක් දක්වා තිබෙනු පෙනේ. ඊට අමතරව ඊ තල හිස් බිලිකොකු සහ නියනකට සමානකම් ඇති මෙවලම් ද ඉඳිකටුවලට සමානකම් ඇති මෙවලම්ද මේ කාලයේ නිපදවා ඇත (Devage, 2014). ලුනුගල්ගේ කැණීමෙන් අනාවරණය කළ ඊතල හිස් ඒවා අයත් කාලයේදී කුඩා සතුන් දඩයම් කිරීමට දක්වූ රුචිය ඉහල ගොස් ඇති බව පෙන්නුම් කරයි.

## සංකේතාත්මක මානවකෘති

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික ස්ථානවලින් සොයාගෙන තිබෙන පුරාවස්තු අතර සංකේතාත්මක මානවකෘති දක්නට ලැබෙන්නේ විරල වශයෙනි. කෙසේවෙතත් කැණීමට ලක් කරන ලද තැන්වලින් සොයා ගන්නා ලද ඇතැම් සංකේතාත්මක පුරාවස්තු නිපදවීමට සැලකිය යුතු තරමේ ශක්තියක් ආයෝජනය කර තිබෙන බව පෙනේ.




**5වන රූපය. ලුනුගල්ගෙයින් සොයා ගන්නා ලද සිදුරු විදින ලද වැලිගලක් (ඡායාරූපයː ඩී. දේවගේ)**

කුඩා ප්‍රමාණයේ සිදුරු 19 ක් කොටන ලද වැලිගලක් ලුනුගල්ගේ අංක 4 දරණ ප්‍රසංගයෙන් වාර්තා වී තිබේ. එය සෙන්ටිමීටර 32 ක දිගින් සහ සෙන්ටිමීටර 17 ක පළලින් යුක්තය. එහි කොටා තිබෙන සිදුරක ගැඹුර සෙන්ටිමීටර 0.3 සිට 0.8 දක්වා පරාසයකට අයත්ය. සිදුරු කොටා තිබෙන වපසරිය වටා නාරටියක් ඉස්මතු කර තිබීම සිදුරු කෙටීමේ ක්‍රියාව සවිඥානික ක්‍රියාවක් බව සිතීමට පොලඹවයි.




**6වන රූපය . පරීක්ෂාවට ලක් කරන ලද ගල්ගෙවල්වලින් සොයා ගන්නා ලද පබළු සමහරක් (ඡායාරූපය: ඩී. දේවගේ)**

මිනිස් හදවතක හැඩයට සකසන ලද රතු පැහැති කහඳ ගල් පතුරක් උඩුපියන් ගල්ගෙයින් සොයා ගැනිණි. එය සෙන්ටිමීටර 2.55 ක දිගින් හා සෙන්ටිමීටර 1.8ක පළලකින් යුක්ත වූවකි. එහි ඉහල කොටසේ විනිවිදින ලෙස කළ කුඩා සිදුරක් තිබේ. එය කිසියම් ආකාරයක නූලක් වැනි දෙයක් යවා එම තැල්ල

ගෙලෙහි පැලඳීමට සකස් කළ එකක් බව පෙනේ. පබළු සහ ගෙල පලඳනා ලෙස සකස් කළ පුරාවස්තු ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රාග්ඓතිහාසික ස්ථානවලින්ද සොයා ගෙන තිබේ.




**7වන රූපය. උඩුපියන්ගල්ගෙයින් සොයා ගන්නා ලද කහඳ ගලින් නිමැ වූ මාලපෙත්තක් (ඡායාරූපය: කර්තෘ විසිනි)**

(Deraniyagala 1992; Perera 2010). උඩුපියන් ගල්ගෙයින් එවැනි ගෙල පලඳනා දෙකක් සොයා ගැනීමට හැකි විය.

සතුන්ගේ අස්ථි සහ දත්වලින් නිමවන ලද පබළු 4 ක් ඉලුක්කුඹුරේ අළුගල්ගෙයින් ලැබිණි. සතෙකුගේ දතකින් සාදන ලද පබළු ඉතා ඉහල ශිල්පීය නිපුණතාවක් පෙන්නුම් කරයි. එවැනි දෙයක් හැඩ ගැස්වීමට නම් සියුම් ඉවසීමක් සහ ශ්‍රමයක් අවශ්‍ය ය. මේ අතර තිබෙන මනස්කාන්ත නිදර්ශනය නම් මෝර දතකින් කළ තැල්ලයි. එහි සිදුරක් විද ගෙලෙහි පැලඳීමට සකස් කර ඇත.




8 වන රූපය . අළුගල්ගෙයින් සොයා ගන්නා ලද ගල් පුවරුවක
දැක්වෙන  පින්තාරු කළ සටහනක්

අලුගල්ගෙයින් සොයා ගන්නා ලද මීටර 0.46 ක දිගකින්ද මීටර 0.30 පළලකින්ද මීටර 0.10 ක ඝනකමකින්ද යුත් නයිස් පාෂාණමය ගල්පතුරක සුදු පැහැයෙන් සටහන් කළ සටහනක් දක්නට තිබිණි. එය ඉරිවලින් අඳින ලද ජාල සටහනකි. කිසියම් මැලියම් වර්ගයක් සුදු වර්ණය සමග මුසු කර මෙම සටහන ඇඳ තිබේ. සිරස් ඉරි 9ක් සහ තිරස් ඉරි 4 ක් ද මෙම සටහනට ඇතුළත්ය. මීට අමතර වශයෙන් ඇල ආකාරයට ඇඳ තිබෙන ඉරි කිහිපයන්ද එහි දක්නට ඇත. මෙම සටහනෙන් කුමක් අදහස් කරන්නට ඇත්දැයි වටහා ගත නොහැකිය.






9a සහ 9b වන රූපය. වල්මීතලාවේ පිහිටි හුණුගල් ගුහාවකින් සොයා ගන්නා ලද ලිංග සංකේත දැක්වෙන මූර්ති

නයිස් සහ වැලිගල්වලින් නිමවන ලද ලිංග සංකේත කිහිපයක් වල්මීතලාවේ හුනුගලාගල ගල්ගුහාවෙන් සොයා ගැනිණි. මෙම එකතුවට කාන්තා ලිංග සංකේත 2 ක් සහ පිරිමි ලිංග සංකේත 2 ක් ද අයත් ය. මනුෂ්‍ය ශරීරයේ කොටස් ආකෘතිකාකාරව මූර්තිමත් කිරීම නවශිලා යුගයේ සිට පවතින සිරිතකි. ඒ කාලයට අයත් ලිංග සංකේත එකිනෙකට වෙනස් බුද්ධිමය ප්‍රවේශ හරහා විග්‍රහයට ලක්ව තිබේ (බලන්න Baily 1996; Haaland and Haaland 1996; Hamilton 1996; Marcus 1996; Ucko 1996; Lesure 2002). පරීක්ෂා කරන ලද ගල්ගුහා කැණීමෙන් සොයා ගන්නා ලද පුරාවස්තුවලින් පෙන්නුම් කරන ප්‍රධාන ලක්ෂණය නම් දියුණු දඩකරුවන් හොලෝසීන යුගයේ මැද භාගයේදී දෛහ්‍යමය නිරූපන මගින් ප්‍රකාශිත නව විශ්වාස පද්ධතියක් වෙත නැඹුරු වීමයි.




**10 වන රූපය . අළුගල්ගේ කැණීමෙන් සොයා ගන්නා ලද සුනඛයෙකුගේ මුහුණක් දක්වන මැටි මූර්තියක්**

පුළුස්සන ලද මැටිවලින් තනන ලද කුඩා ප්‍රමාණයේ සුනඛ රූපයක් අලුගල්ගේ කැණීම් වළේ තෙවන මට්ටමේ දී මතු විය. ටෙරාකොටා නමින් හැඳින්වෙන පුළුස්සන ලද මැටියෙන් නිම කළ එම මූර්තියේ පිටත පෘෂ්ඨයේ තුනී හුණු ස්තරයක් ආලේප කර තිබිණි. ඉන් එක් මූර්තියකට සුදු පැහැයක් ලැබී ඇත. සුනඛයෙකුට අයත් ඇටසැකිල්ලක කොටස් බෙල්ලන්බැඳිපැලැස්සෙන් සොයා ගෙන ඇති අතර, එය මින් පෙර වසර 6500කට දින නිර්ණය වී තිබේ. අම්පාර දිස්ත්‍රික්කයට අයත් නිල්ගල ප්‍රදේශයේ ගල්ගුහාවකින් ද ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සුනඛයෙකුගේ අස්ථි කැබලි වාර්තා වී ඇත. වර්තමාන සුනඛයින් පිළිබඳ සිදු කර තිබෙන ගෝලීය පරිමාණයේ මයිටොකොන්ඩ්‍රියල් සහ Y-ක්‍රොමොසෝම ජාන අධ්‍යයනවල ප්‍රතිඵල අනුව ඒ සත්ත්වයා ආසියාවේ ගෘහාශ්‍රිතකරණයට ලක්ව ඇත්තේ අග්නිදිග ආසියාවේදී ය (Savolainen et al, 2002; Ding et al, 2012). ඒ ක්‍රිස්තු පූර්ව 14000ත් 9000ත් අතර කාලයකදී ය (Freedman et al, 2014).

## සාරාංශය

ක්ෂේත්‍ර ගවේෂණවල ප්‍රතිඵලයක් ලෙස අපට අවබෝධ කර ගත හැකි ප්‍රධාන කාරණය නම් පරීක්ෂා කරන ලද බිම් තීරුවේ පුළුල් ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තියක් තිබෙන බව යි. ඒ අතරින් බොහෝමයක් ඒවා තාවකාලික කඳවුරු ය. එවක ප්‍රාග් ඓතිහාසික ප්‍රජා කණ්ඩායම් සිය ආහාර සෙවීමේ කටයුත්ත වෙනුවෙන් වැඩි ශ්‍රමයක් යෙදවීමෙන් කඳු අතර සංචරණය කර ඇති බව එම අවකාශීය පැතිරීම මගින් අප වෙත පෙන්වා

දෙන පැහැදිලි කාරණය යි. හොලෝසීන යුගයේ පැවති දේශගුණික දෝලන තත්ත්ව මගින් කඳුකරයේ පැවති ආහාර සම්පත් වෙත ඍජු බලපෑමක් ඇති කරන ලද අතර, එමගින් ප්‍රාග් ඓතිහාසික ජනතාව වෙත සිය පැවැත්ම පිළිබඳ කිසියම් අවිනිශ්චිතතාවක් ජනනය කරන ලද බව පෙනේ. එමගින් ඇති කරන ලද ආතතිය ඔවුන්ට තීරණ ගැනීමේ දී බලපෑමක් ඇති කරන ලද බව වැටහෙන්නේ දඩයමට සාපේක්ෂ ව ශාක ආහාර පරිභෝජනය ඉහළ දැමීමට ඔවුන් විසින් ගෙන තිබෙන තීරණය දෙස අවධානය යොමු කරන විට ය.

මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක සන්දර්භය තුළ කැපී පෙනෙන ලක්ෂණය වනුයේ සම්ප්‍රදායික දඩකරුවන්ගේ ජීවන රටාවේ සිදුවූ බව පෙනෙන ක්‍රමානුකූල පරිවර්තනය යි. ඔවුන්ගේ තාක්ෂණයට නව පන්නයේ ගල්මෙවලම් ආකෘති කිහිපයක් එකතු වීම එහි ප්‍රතිඵලයකි. මෙහි දී අපගේ යෝජනාව වන්නේ මධ්‍යශිලා යුග දඩකරුවන්ගේ මෙකී පරිවර්තනය යකඩ භාවිතයට හුරු වීමට අවශ්‍ය කරන පූර්ව අනුවර්තනයක් වූ බවයි. ඊට අවශ්‍ය කරන සානු බලය සපයන ලද්දේ හොලෝසීන යුගයේ පැවති දේශගුණික දෝලනවල ස්වරූපය යි. විශේෂයෙන් ම අතරමැදි දේශගුණික කලාප ඒ වෙනුවෙන් දක්වන ලද දායකත්වය තීරණාත්මක වූවකි. මෙම සංස්කෘතික පරිසර අන්තර් ක්‍රියාව ක්‍රිස්තුපූර්ව 5000 දී පමණ පුරාවිද්‍යාත්මක ව පිළිබිඹු වන බව මෙතෙක් සාකච්ඡා කළ කරුණු අනුව පැහැදිලි වෙයි. සංකේතාත්මක භාණ්ඩ නිපදවීමට ඔවුන් විසින් දරා තිබෙන උත්සාහය මෙම පරිවර්තනය ඉදිරියේ ලෝකය දෙස නවතාවකින් බැලීමට ඔවුන් ගත් උත්සාහය

මැනවින් නිරූපණය කරයි. මෙම කථාව සම්පූර්ණ කිරීමට නම් තවදුරටත් පරීක්ෂා කිරීම් අවශ්‍ය ය. වැඩි දින වකවානු ආවලියක් මෙන් ම ශාක සම්බන්ධයෙන් වන ආංශුක සාක්ෂි ද මෙහි දී වැදගත් වෙයි.

(**ස්තූතිය** - මෙම රචනයට පදනම් වූ පර්යේෂණ සඳහා ප්‍රතිපාදන සපයන ලද්දේ ජාතික විද්‍යා පදනමයි (පර්යේෂණ දීමනා අංක IK/2014/1). මම ඒ ආයතනය වෙත කෘතවේදී වෙමි. කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයද ඒ සඳහා පාර්ශවික ප්‍රතිපාදන පිරිනැමීය. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට සහ එම ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙතද මෙහිදී මගේ ස්තූතිය පල කළ යුතුය)

# ආශ්‍රිත ග්‍රන්ථ


Agrawal, D.P.,& Kusumgar, S. (1974). *Prehistoric Chronology and Radiocarbon Dating in India.* New Delhi: Munshiram Manoharlal.

Akazawa, T. (1982). Cultural Change in Prehistoric Japan: Receptivity to Rice Agriculture in the Japanese Archipelago. In: Wendorf, F., Close, A.E. (eds) *Advances in World Archaeology* 1, 151-211. New York: Academic Press.

Bailey, J.F., Richards, M.B. Macaulay,V A., Colson, I.B., James, I.T. et al. (1996). Ancient DNA suggests a recent expansion of European cattle from a diverse wild progenitor species. *Philosophical Transactions of the Royal Society Series* B 263, 1467-1473.

Bandaranayake, S. (1992). The Settlement Patterns of the Proto-historic-Early Historic Interface in Sri Lanka. In: Jarrige, C. (ed)*South Asian Archaeology, Papers from the Tenth International Conference of South Asian Archaeologists in Western Europe*, 15-24. Madison Wisconsin: Prehistory Press.

Butzer, C. (1971). *Environment and Archaeology: An Ecological Approach to Prehistory*. Chicago: Aldine.

Butzer, C. (1985. *Archaeology as Human Ecology*. Cambridge: Cambridge University Press.

Chandrapala, D. (2007). Rainfall: Physical and Biological Environment. The National Atlas of Sri Lanka, 2nd edition, 58-59 *pp* Colombo: Survey Department of Sri Lanka.

DeMenocal, P.B. (1995). Plio-pleistocene african climate. Science 270. 53-59.

Deraniyagala, P. E. P. 1958. An open-air habitation site of Homo sapienbalangodensis. *SpoliaZeylanica* 28: 223-261.

Deraniyagala, S. (1970). The citadel of Anuradhapura in 1969 excavation in the Gedige area. *Ancient Ceylon* 2: 148-169.

Deraniyagala, S. (1992). The Prehistory of Sri Lanka. Colombo: Department of Archaeological Survey.

Devage. D. D. (2014). Technological characteristics of the stone implements in the Pre and Proto-historic transition in Sri Lanka (*unpublished MSc thesis*).Postgraduate Institute of Archaeology. Colombo: Postgraduate Institute of Archaeology.

Ding, Z., Oskarsson, M., Ardalan, A., Angleby, H., Dahlgren, L. et al. (2012).Origins of domestic dog in Southern East Asia is supported by analysis by Y-chromosome DNA. *Heredity*108(5), 507-514.

Fairbridge, R.W. (1976). Effects of Holocene climate change on some tropical geomorphic processes. *Quaternary Research* 6:529-556.

Freedman, A, Gronau, I., Schweizer, R., Ortega-Del Vecchyo, D. et al.(2014). Genome sequencing highlights the dynamic early history of dogs. *PLoS Genetics* 10(1): e1004016.

Gamble, C. (1986). The Mesolithic sandwich: ecological approaches and archaeological records of the early postglacial. In: Zvelebil, M. (eds.) *Hunters in Transition Mesolithic Societies of Temperate Eurasia and their Transition to Farming*, 33-42. Cambridge: Cambridge University Press.

Goudie, A.S., Allchin, B., Hegde, K.T. M.(1973). The former extensions of the Great Indian Sand Desert. *Geographical Journal* 139(2): 243-258.

Gupta, H.P. (1974). Late Quaternary vegetational history in western region. In: Suranga, K.R., Lakhanpal, R.N., Bharadwaj, D.C.(eds.)*AspectandAppraisalofIndianPalaeobotany*,644-650. Luckow: BirbalSahni Institute.

Hamilton, N. (1996). The Personal is Political. *Cambridge Archaeological Journal*6(2): 282-285.

Haaland, G., Haaland, R.(1996). Levels of Meaning in Symbolic Objects. *Cambridge Archaeological Journal* 6(2): 295-300.

Kenover, J. M. (1998). *Ancient Cities of the Indus Valley Civilization*. Karachi: Oxford University Press.

Krishnamurty, R.V., Agrawal, D. P., Misra, V. N., Rajaguru, S. N. (1981). Palaeoclimatic Influences from the Behaviour of Radiocarbon Dates of Carbonates from Sand Dunes of Rajasthan, *Proceedings of the Indian Academy of Sciences (Earth Planet Science)* 90: 155-160.

Lesure, R. G. (2002). The Goddess diffracted: thinking about the figurines of early villages. *Current Anthropology* 43(4): 587-610.

Lieth, H. (1973). Primary Productivity: Terrestrial Ecosystems. *Human Ecology* 1:303-332.

Marcus, J. 1996. The importance of Context in Interpreting Figurines. *Cambridge Archaeological Journal* 6(2): 285-291.

Pearson, G.W., &Stuiver, M. (1986). High-precision calibration of the radiocarbon time scale, 500-2500 BC. *Radiocarbon* 28 (2B): 839-862.

Perera, N. (2010). Prehistoric Sri Lanka Late Pleistocene rock-shelters and an open-air site. *BAR International Series* 2142 (2010), Oxford: Archaeopress.

Premathilake, R. (2003). Holocene plaeoecological records of climatic and human impact on vegetation in the Horton Plains, Sri Lanka. In: Late Quaternary Palaeoecological Event Stratigraphy in the Horton Plains, Central Sri Lanka. Thesis in Quaternary Geology by Premathilake, R. Paper V. Stockholm: Stockholm University.

Premathilake, R., J. Risberg, (2003). Late Quaternary climate history of the Horton Plains, central Sri Lanka. *Quaternary Science Review* 22:1525-154.

Premathilake, R., Gunatilaka, A. (2013). Chronological framework of Asian Southwest Monsoon events and variations over the past 24,000 years in Sri Lanka and regional correlations. *Journal of National Science Foundation in Sri Lanka*41(3): 219-228.

Rajaguru, S.N. (1973). Late Pleistocene climatic change in western India. In: Agrawal, D.P, & A. Ghosh (eds)*Radiocarbon and Indian Archaeology*. Bombay: Tata Institute.

Rowley-Conwy, P. (1986). Between cave painters and crop planters: aspects of the temperate European Mesolithic. In: Zvelebil, M., (ed) *Hunters in Transition Mesolithic Societies of Temperate Eurasia and their Transition to Farming*, 17-32. Cambridge: Cambridge University Press.

Savolainen, P., Zang, Y.,Lunderberg, J.,&Leitner, T. (2002). Genetic evidence for an East Asian origin of domestic dogs. *Science* 298(5598): 12387-12390.

Ucko, P. J. (1996). Mother, Are You There? *Cambridge Archaeological Journal* 6 (2):300-304. Shinde, V.S., Yasuda, Y., Possehl, G. 2001. Climatic conditions and the rise and fall of Harappan Civilization of South Asia. *Monsoon* 3:92-94.

Shinde, V.S., ShwetaSinhaDeshpande, Yasuda, Y. (2004). Human Response to Holocene Climate Changes in Western India between 5th and 3rd Millennium BC. In: Yasuda, Y. & V.S. Shinde (eds)*Monsoon and Civilization*, 383-406. New Delhi: Roli Books.

Singh, G. (1971). The Indus Valley Culture. *Archaeology and Physical Anthropology in Oceania* 6(2):177-189.

Somadeva, R. (2014). *Archaeology of Mountains.* Colombo: Postgraduate Institute of Archaeology.

Weber, S. (1999). Seeds of Urbanism: Paleoethnobotny and the Indus Civilization. *Antiquity* 73(282): 812- 826.

## දේශකයා පිළිබඳ ව . . . . .

රාජ් සෝමදේව 1982 වසරේදී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව එහි සමාජ විද්‍යා පීඨයෙන් පුරාවිද්‍යාව පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී දෙවන පෙළ උපාධිය ලබා ගත්තේය. 1989 දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සහකාර කථිකාචාර්යවරයෙකු බැඳුනු ඔහු 1994 වසරේදී කැලණිය විශ්ව විද්‍යාලයෙන් පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය හිමි කරගත්තේය. 2006 වසරේදී ස්වීඩනයේ උප්සලා විශ්ව විද්‍යාලයේ දර්ශන පීඨයේ අප්‍රිකානු සහ සන්සන්දනාත්මක පුරාවිද්‍යා අංශයෙන් දර්ශනශූරී උපාධිය දිනා ගත්තේය. එම උපාධිය සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ Urban Origins in Southern Sri Lanka යන ශීර්ෂයෙන් යුත් පර්යේෂණ නිබන්ධය එම විශ්වවිද්‍යාලයේ ප්‍රකාශයක් ලෙස ප්‍රසිද්ධියට පත් කළේය. 1990 වසරේදී ඔහු බටහිර ජර්මනියේ බොන් නගරයේ පිහිටි සන්සන්දනාත්මක පුරාවිද්‍යාව පිළිබඳ ආයතනයේ ආරාධිත පර්යේෂකයෙකු ලෙස කටයුතු කළ අතර, 2005 වසරේදී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා ආයතනයෙන් පිරිනමන චාල්ස් වොලස් අධිශිෂ්‍යත්වය දිනා ගත්තේය.

1989 දී ඔහු සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ සීගිරිය-දඹුල්ල ව්‍යාපෘතිවල පුරාවිද්‍යාව පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් විය. ඊට සමගාමීව ශ්‍රීලංකා-ජර්මන් සහයෝගීතාව මත ක්‍රියාත්මක කරන ලද ඉබ්බන්කටුව-පිදුරංගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය සහ ස්විඩනයේ සීඩා-සරෙක් ආධාර මත ක්‍රියාවට නගන ලද සීගිරිය-දඹුල් ප්‍රදේශයේ පුරාණ ජනාවාස ගවේෂණ ව්‍යාපෘතියේ ක්ෂෙත්‍ර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කළේය.

1998 වසරේදී ඔහු ශාස්ත්‍රීය නායකත්වය සහ සාර්ථකත්වය උදෙසා පිරිනමන ටොප් ටෙන් සම්මානය දිනා ගත්තේය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩල සාමාජිකයෙකු කටයුතු කළ ඔහු 2015-16 වසරවලදී ජාතික පර්යේෂණ සභාවේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කළේය. 2014 වසරේදී ඔහුට සිය පර්යේෂණ කටයුතු සඳහා ජාතික විද්‍යා සභාවෙන් පර්යේෂණ ප්‍රතිපාදනයක්ද පිරිනැමිනි.

## සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර අනුස්මරණ දේශන මාලාව

01. මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය. (1988). අධ්‍යාපනයේ ප්‍රජාතන්ත්‍රීකරණයඃ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගෙන් ඉටුවූ සේ- වය.

02. මහාචාර්ය ස්වර්ණා ජයවීර. (1989). අධ්‍යාපන අවස්ථා ව්‍යාප්ත කිරීම නොනිමි කර්තව්‍යය.

03. මහාචාර්ය කේ. ඩබ්ලිව්. ගුණවර්ධන. (1990). අතීතය පිළිබඳ කන්නන්ගර දර්ශනය - යටත් විජිත පාලන සමයේ අධ්‍යාපනය, ආගම, සංස්කෘතිය හා සමාජය.

04. දේශබන්දු බෝගොඩ ප්‍රේමරත්න. (1991). අධ්‍යාපනය, නිදහස රැකගැනීම පිණිස විය යුතු ය. නිදහස් අධ්‍යාපනයට නව අර්ථකථනයක්.

05. දේශමාන්‍ය, කලාකීර්ති ආචාර්ය ආනන්ද ඩබ්ලිව්. පී. ගුරුගේ 1992 අධ්‍යාපනය මෙහෙයවීමේ බලයඃ අදාළ බව හා තත්ත්වය කෙරෙහි ඇති ආභාෂය.

06. මහාචාර්ය ජී. එල්. පීරිස්. (1993). ජාතික සංවර්ධනයට පදනමක් වූ කන්නන්ගර ප්‍රතිසංස්කරණ.

07. මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක. (1994). ස්වාධීනත්වය උදෙසා අධ්‍යාපනය - සංවර්ධනය, පෞද්ගලික නිෂ්ඨාවන් හා සමාජ ප්‍රමුඛතාවන් සම්බන්ධ ගැටලු.

08. මහාචාර්ය ඩබ්ලිව්. ආරියදාස ද සිල්වා. (1995). ජාතික අධ්‍යාපන ක්‍රමයක් පිළිබඳ සංකල්ප.

09. මහාචාර්ය චන්ද්‍රා ගුණවර්ධන. (1996). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය බලවත්ත කිරීමේ මෙවලමක් ද? නැතහොත් සමාජ සචලතාව ලබා ගැනීමේ උපකරණයක් ද?

10. ඩී. ඒ. පෙරේරා. (1997). ඉගෙනීම හා ඉගැන්වීම සඳහා අවශ්‍ය නිදහස.

11. සිවනන්දිනී දොරේසාමි. (1998). හින්දු සමයවාදී අධ්‍යාපනය සහ ආචාර්ය කන්නන්ගර අධ්‍යාපන දර්ශනය.

12. ආචාර්ය ප්‍රේමදාස උඩගම. (2001). යටත් විජිතවාදය, ගෝලීයකරණය සහ අධ්‍යාපනය.

13. මහාචාර්ය ජේ. බී. දිසානායක. (2002). මංසන්ධියකට එළඹ ඇති භාෂාවක්: සිංහල භාෂාවේ වර්තමාන තත්ත්වය ගැන විමර්ශනයක්.

14. මහාචාර්ය ඒ. ඩී. වී. ද එස්. ඉන්ද්‍රරත්න. (2003). අධ්‍යාපනය සහ සංවර්ධනය: සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගරයන්ගේ භූමිකාව.

15. සුසිල් සිරිවර්ධන. (2004). ශ්‍රී ලාංකික සමාජය හා රාජ්‍ය ප්‍රතිනිර්මාණයට කන්නන්ගර දායාදය සම්පතක් හා පාඨයක් වශයෙන්.

16. ඇම්. සී. පාන්ට්. (2005). විවෘත පාසල් අධ්‍යාපන සංකල්පය පරිණාමය හා භාවිතය (ඉන්දියානු පරියාලෝකය).

17. ජනාධිපති නීතිඥ එච්. එල්. ද සිල්වා. (2006). බහු සංස්කෘතික සමාජයක් තුළ ශ්‍රී ලාංකික අනන්‍යතාවක ඉදිරි සැලැස්මක් ප්‍රතිෂ්ඨාපනය කිරීම.

18. ආචාර්ය. ඒ. ජී. හුසේන් ඉස්මයිල්. (2007). ජනවර්ග අතර අධ්‍යාපනයේ සම අවස්ථා සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවගේ අධ්‍යාපනය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණයක්.

19. මහාචාර්ය නාරද වර්ණසූරිය. (2008). වර්තමාන සන්ධර්භය තුළ කන්නන්ගර උරුමය: උසස් අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය භූමිකාව.

20. මහාචාර්ය කාලෝ ෆොන්සේකා. (2009). කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල නොනිමි කර්තව්‍ය පූර්ණය කිරීම.

21. මහාචාර්ය ගාමිණී සමරනායක. (2010). ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගැටලු හා අභියෝග පිළිබඳ සමස්තාවලෝකනයක්.

22. මහාචාර්ය ඒ. වී. සුරවීර. (2011). ආචාර්ය කන්නන්ගර නිදහස් අධ්‍යාපන යෝජනා හා ටියුෂන් ව්‍යාපාරයේ පශ්චාත්කාලීන ව්‍යාප්තිය.

23. ආචාර්ය. ජී. බී. ගුණවර්ධන. (2012). කන්නන්ගර දැක්ම: අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අභියෝග.

24. මහාචාර්ය ඒ. කේ. ඩබ්ලිව්. ජයවර්ධන. (2013). අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් දැනුම කේන්ද්‍රීය වූ පුරවැසි ගුණාංග සපිරුණු අධ්‍යාපනයක් කරා.

25. ආර්. එස්. මැදගම. (2014). පශ්චාත් කන්නන්ගර යුගයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සමාලෝචනයක්.

26. මහාචාර්ය එස්. සන්දරසේගරම්. (2015). කන්නන්ගර ප්‍රතිසංස්කරණ හා උදා වන ශ්‍රී ලාංකික දැනුම් ආර්ථිකය.

27. ආචාර්ය උපාලි එම්. සේදර. (2016). කන්නන්ගර යුගයෙන් ඔබ්බට: 21 වැනි සියවස සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ.

28. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන. (2017). වෛද්‍ය අධ්‍යාපනය සහ කන්නන්ගර දර්ශනය.

29. ආචාර්ය සුනේත්‍රා කරුණාරත්න (2018). සමානතාවට එරෙහිව සමතාව

30. ආචාර්ය උපාලි මාම්පිටිය. (2019). හෙට ලෝකය සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතීයික හා විද්‍යාලයීය තලයේ විෂයමාලාවලට නව අර්ථ කථනයක්.